විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (12)
W.A. විමලසේන සර් - 2022. 02. 06
**(12.30 – 3.30)**

# විෂයමාලාව ක්‍රියාත්මක කිරීම



- විෂයමාලාව ක්‍රියාත්මක කිරීම යනු කුමක්ද ?
- විෂයමාලාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම යනු කුමක්ද ?
- විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ ස්වභාවය.
- විෂයමාලාව ක්‍රියාත්මක වන ආකාරය තක්සේරුව හා ඇගයීම.

## විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

විෂයමාලාව වැඩ සටහනකි. සැලසුම්සහගතව ඉදිරිපත් කරනු ලබන විෂය මාලාව ක්‍රියාත්මක තලයේ දී එහි ක්‍රියාත්මක වීම, ක්‍රියාත්මක වීමේ ස්වභාවය, ක්‍රියාත්මක වීමේ වේගය ආදී කරුණු විශේෂයෙන් ම සලකා බැලිය යුතුය. ඒ අනුව විෂය මාලාව ක්‍රියාත්මක වීම ලෙස අදහස් වන්නේ,

'' සැලසුම් සහගත විෂයමාලාවක් පන්ති කාමරය තුළ සාර්ථකව දියත් කිරීමයි. තවදුරටත් පැහැදිලි කළහොත් විෂය මාලාව ක්‍රියාත්මක කිරීම යනු නව ව්‍යවහාර පරීක්ෂා කරන අතර එය කුමක් ද යන්න දැකිය හැක්කේ පාසල් පද්ධතිය තුළ භාවිතා කරන විට ය. ඒ අනුව සැබෑ ලෙස පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විෂය මාලාව ක්‍රියාත්මක කිරීම වේ.''

විෂය මාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ විවිධ නිර්වචන ගණනාවක් අධ්‍යාපනඥයන් ඉදිරිපත් කර ඇත. 2003 දී <u>මාර්ස් සහ වීල්ස්</u> යන අධ්‍යාපනඥයින් විෂය මාලාව ක්‍රියාත්මක කිරීම යනු කුමක්දැයි පහත ආකාරයට පෙන්වා දී ඇත.

'' විෂයමාලාව සැලැස්මක්ව ආරම්භ වේ. එහි යථා ස්වභාවය මතු වන්නේ ගුරුවරු විසින්ම පංතිකාමරයේ සිසුන්ට ක්‍රියාත්මක කිරීමෙන් පමණි. ඔවුන් තමන්ගේ පන්ති කාමරය තුළ විෂය මාලාව ක්‍රියාත්මක කරන්නේ කෙසේද? එම නිසා විෂය මාලාව ක්‍රියාත්මක කිරීම යනු සැලසුම් සහගත විෂයමාලාව අභිනය කිරීමෙන් ක්‍රියාවලියක්ව සැලකීමය. ''

ඒ අනුව බලන කල විෂය මාලාව ක්‍රියාත්මක කිරීම යනු ගුරුවරයා සැබෑ ලෙසම විෂයමාලාව ළමුන් සමඟ සම්බන්ධ කිරීමට ගන්නා උත්සාහයයි. සැබෑ ලෙසම විෂය මාලාව ක්‍රියාත්මක වීමේදී ගුරුවරයාගේ වෘත්තීය සංවර්ධන ක්‍රියාවලියක් ද වර්ධනය වේ. එමෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සැබෑ අත්දැකීම් ලබාදීමට උනන්දු වේ. එම කණ්ඩායම තුළ යහපත් ආකල්ප හා චර්යාවන් ද ගොඩනැංවීමට හැකියාව ලැබේ. ඒ අනුව විෂය මාලාව ක්‍රියාත්මක කිරීම සැබෑ ලෙසම සිසුන් අතර දියත් කිරීම බව ප්‍රකාශ කළ හැකිය.

## විෂයමාලාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම

විෂය මාලාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම යනු පන්ති කාමරය තුළ විෂය මාලාව ක්‍රියාත්මක කිරීමේදී විෂය මාලාව පිළිබඳ පුළුල් දැක්මක් සහිතව කටයුතු කිරීමය. එහිදී ක්‍රියාත්මක කරන්නා එනම්,

- ගුරුවරුන්
- විදුහල්පතිවරුන්
- අධ්‍යාපන නිලධාරීන්

විෂයමාලා අන්තර්ගතය පිළිබඳ ඉතා හොඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුය. විෂයමාලාවේ අභිලාෂ හඳුනාගනිමින් සැබෑ ලෙසම විෂයමාලාව අවබෝධ කිරීම මෙහිදී ඉතා වැදගත් වේ. සාර්ථකව විෂය මාලාව ක්‍රියාත්මක වීමේ දී ගුරුවරු තම අනිත් කණ්ඩායම් සමග මනා සම්බන්ධතාවක් ගොඩනගා ගත යුතුය. එසේ වුවහොත් පමණක් සැබෑ ප්‍රතිලාභ ලබාදිය හැකිය.

## විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ ස්වභාවය

විෂය මාලාව ක්‍රියාත්මක කිරීමේ සවභාවය යනු '' සැලසුම් කරන ලද විෂය මාලාව ක්‍රියාත්මක වීමේ දී නැතහොත් සකසා ඇති ලෙසම ක්‍රියාත්මක වීමයි.'' එහිදී විෂය මාලාව ක්‍රියාත්මක වීමේ ස්වභාවය හදුනා ගැනීමට පහත ලක්ෂණ 04 ඉතා වැදගත් වේ. මෙම අංග 04 පිළිබඳ විස්තරාත්මකව සලකා බැලීමෙන් විෂය මාලාව ක්‍රියාත්මක කිරීමේ ස්වභාවය හදුනා ගත හැකිය. ඒ අනුව,

1. සැලසුම් කිරීම හා ක්‍රියා කිරීම් අතර සම්බන්ධතාවය හඳුනාගැනීම (නියාමනය)
2. ක්‍රියාත්මක කිරීමේ වේගය
3. ක්‍රියා කාලය තුළ සන්නිවේදනය
4. ක්‍රියා කාලය තුල ලැබෙන සහය

යනාදියයි.

1. <u>සැලසුම් කිරීම හා ක්‍රියා කිරීම් අතර සම්බන්ධතාවය හඳුනාගැනීම (නියාමනය)</u>

සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තුළ අවශ්‍ය සම්පත් සොයා බැලිය යුතුය. නිශ්චිත කරන ලද තීරණ, පරිපාලන ප්‍රතිපත්ති ආදිය සැබෑ ලෙසම ක්‍රියාත්මක කරන්නේද යන්න සැලසුම් ක්‍රියාවලියේදී ම සොයා බැලිය යුතුය. එනම් සැලැස්ම සමග විෂයමාලාව නියාමනය විය යුතුය.

2. <u>ක්‍රියාත්මක කිරීමේ වේගය</u>

විෂයමාලාවක් වෙනස් කිරීමට යම් කාලයක් අවශ්‍ය වේ. නව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරයාට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වේ. සෑම ගුරුවරයෙක්ම එක හා සමාන මට්ටමින් නොමැති නිසා විෂය මාලාවේ නවීකරණයන් සඳහා යම් කාලයක් ගත වේ. එසේ වුවත් විෂයමාලාව ක්‍රියා කිරීම සුදුසු මට්ටමින් වේගවත් විය යුතුය.

විෂයමාලාවේ වෙනස එකවර සිදුවුවහොත් එය ක්‍රියාත්මක වීමේ වේගය ද කාලයක් ගත යුතු වේ. එබැවින් විෂය මාලාව වෙනස් කිරීමේදී වෙනස් කිරීමට අපේක්ෂිත කරුණු, වෙනස්කම් ගුරුවරුන් හා සිසුන් සිතන්නේ කෙසේද? ආදිය සොයා බැලිය යුතුය.

3. <u>ක්‍රියා කාලය තුළ සන්නිවේදනය</u>

විෂය මාලාව ක්‍රියාත්මක වන ස්වභාවය අනුව පාසලේ සංනිවේදන ජාලය වැදගත් වේ. විෂය මාලාව ක්‍රියාත්මක වන කාලය තුළදී වර්ග 02 ක සන්නිවේදනයක් ක්‍රියාත්මක වේ. එනම්,

- සිරස් සන්නිවේදනය - ප්‍රධානියා අතර
- තිරස් සන්නිවේදනය - තම කණ්ඩායම් අතර

විෂයමාලාව ඉගැන්වීමේ දී මෙම සන්නිවේදන ජාලය බිඳ වැටුණහොත් විෂයමාලාවේ වෙනස්කම් කිරීමට අපොහොසත් වේ. එපමණක්ද නොව පාසලේ සේවා පුහුණුව, කාර්යමය පුහුණුව, වෘත්තීය සංගම්, පරිපාලන කටයුතු මෙහෙයවීමේදී මනා සන්නිවේදනයක් ගොඩනඟා ගතයුතු වේ. මේ තුළින් විෂයමාලාව සැබෑ ලෙස ක්‍රියාත්මක වීමේ ස්වභාවය පාසලක දක්නට ලැබේ.

4. <u>ක්‍රියා කාලය තුල ලැබෙන සහය</u>

විෂයමාලාව සැබෑ ලෙසම ක්‍රියාත්මක කරන විට පාසලේ අනෙකුත් කණ්ඩායම් සමග සහයෝගී වැඩපිළිවෙළක් තිබිය යුතුය. එමෙන්ම පන්ති කාමරය තුළ ඉගෙනුම් වාතාවරණය නිවැරදිව ගොඩනඟා තිබීම ඉතා වැදගත් වේ. ඒ සඳහා විදුහල්පති ඇතුළු පාසලේ සෑම කණ්ඩායමකගේ ම සහාය අත්‍යාවශ්‍ය වේ.

එබැවින් සාර්ථකව විෂය මාලාව ක්‍රියාත්මක වීමේ දී ඉහත අංග අවධාරණය කළ යුතු බව අපට පැහැදිළි වේ.

## <u>විෂයමාලාව ක්‍රියාත්මක වන ආකාරය තක්සේරුව හා ඇගයීම (මැනීම)</u>

විෂය මාලාව ක්‍රියාත්මක කරන විට විවිධ මාන ඔස්සේ ක්‍රියාවලිය මැනිය හැකිය. ඒ සඳහා අධ්‍යාපනඥයන් මාන කිහිපයක් නැතහොත් ආකෘති කිහිපයක් උපයෝගී කරගනී. ඒ අනුව විෂය මාලාව ක්‍රියාත්මක වන ආකාරය තක්සේරු කිරීමට පහත මාන දෙක උපයෝගී කරගත හැකිය. ඒ අනුව,

1. ක්‍රියාත්මක වීමේ විශ්වාසතාවය
2. අනුවර්තනය

යනුවෙනි.

1. <u>ක්‍රියාත්මක වීමේ විශ්වාසතාවය</u>

මින් අදහස් වන්නේ අපේක්ෂා කරන ආකාරයට වැඩසටහනකට හෝ විෂයමාලාවට මැදිහත්වීම කුමන මට්ටමෙන් වේද යන්න සෙවීමයි. එහිදී මැදිහත්වීම සඳහා විශ්වාසතා මට්ටමකින් ක්‍රියාත්මක වන්නේ ද යන්න අවබෝධ කරගත යුතුය. විෂය මාලාවක හෝ වැඩසටහනක මැදිහත් වන ආකාරයෙන්ම විෂය මාලාව ක්‍රියාත්මක වන මට්ටම මැනීමට හැකියාව ලැබේ.

2. අනුවර්තනය

අනුවර්තනය යනු විෂයමාලා ක්‍රියාත්මක කරන විට අවස්ථානෝචිතව පාසල හා ගුරුවරු පිළිබඳව, විෂය මාලාව පිළිබඳව, ක්‍රියාත්මක වන ආකාරය, වෙනස්කම් සිදුවන ආකාරය සොයා බැලීමයි. මෙහිදී විෂයමාලාවේ වෙනස්කම් කොතෙක් දුරට සිදුවේ ද යන්න, ගුරුවරු මුහුණ දෙන ආකාරය අනුව මැනගත හැකිය.